## 2018 සැප්තැම්බර් මස මාසික සභා රැස්වීම
## වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

2018 සැප්තැම්බර් මස මාසික සභා රැස්වීම 2018.09.13 වන දින පෙ.ව.10.00 ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වනු ලැබිය.

එදින සභා රැස්වීමට පහත නම් සඳහන් අය සහභාගී වූහ.

| | | |
|---|---|---|
| 1. ගරු උප සභාපති | - | ඩබ්ලිව්.ඒ.සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා |
| 2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා |
| 3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා |
| 4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා |
| 5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එච්.සිරිපාල මැතිතුමා |
| 6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය |
| 7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.ඒ.ගුණතිලක මැතිතුමා |
| 8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ආර්.රත්නපාල මැතිතුමා |
| 9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | පී.ජී.ශාන්ත දෙල්ගහකොට්ටුව මැතිතුමා |
| 12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.එල්.ලාල් කුමාරරත්න මැතිතුමා |
| 13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.කේ.ප්‍රසාද් අසිත මැතිතුමා |
| 14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඒ.ඩබ්ලිව්.සුමනාවතීමැතිතුමිය |
| 15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ආර්.එස්.ධම්මිකා මැතිතුමිය |
| 16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා |
| 17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා |

### නිලධාරී සහභාගීත්වය

| | | |
|---|---|---|
| **1.** ප්‍රාදේශීය සභාවේ ලේකම් | - | එස්.රත්නාවතී මැණිකේ මෙනවිය |
| **2.** කළමනාකරණ සහකාර | - | එච්.ඒ.පී.එන්.හෙට්ටිආරච්චි මිය |

මෙදින සභා රැස්වීමට සහභාගී වූ ගරු සභාපති තුමා විසින් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්,ලේකම් තුමිය ඇතුළු කාර්යමණ්ඩලයත්, පිළිගැනීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

## 1. පසුගිය සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා විසින් 2018.08.08 වන දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාවේ 6.1(II) ගරු සභාපතිතුමාගේ බඳවා ගැනීම් සම්බන්ධව යෝජනාව සඳහා තමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමියගේ අදහස් දැක්වීම ඇතුළත් වී නැති බවින්,එම යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාගේ අභිමතය පරිදි බඳවා ගැනීම් සිදුකරන්නේ නම් ඉදිරියේදී ඒ සම්බන්ධව පැන නගින ගැටළු සම්බන්ධවද වගකීම සභාපතිතුමා විසින්ම දැරිය යුතු බවට වූ අදහස් දැක්වීම සඳහන් කිරීමෙන් පසු පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එන්.වී.ශ්‍රීමාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

## 2. ගරු සභාපතිතුමාගේ නිවේදන

### I. ජල බිල්පතේ නම සංශෝධනය කිරීම

- ජේ.එම්.දයාරත්න යන නමින් UD 179 අංක දරණ ජල බිල් පත ඔහුගේ පුතා වන ජේ.එම්.මංචුල නිශාන්ත දයාරත්න නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.
- යූ.එම්.සෙනවිරත්න යන නමින් ඇති ජල බිල් පත නිමල් රුබසිංහ යාපා නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.
- ජී.සුනිල් ශාන්ත යන නමින් ඇති ජල බිල් පත ආර්.එම්. ප්‍රියරත්න නමින් සංශෝධනය වන බව සභාවේ දැනගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## 3. සභාව නමින් ලැබී ඇති ලිපි ,පෙත්සම් හා පැමිණිලි ඉදිරිපත් කිරීම

### 3.1. නිවාඩු අනුමත කර ගැනීම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.ඉන්ද්‍රජිත් සමන්ජීව මැතිතුමා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි.පී.රණතුංග මැතිතුමා අසනීප වීම හේතුවෙන් අද දින සභා රැස්වීමට සහභාගී නොවන බව දන්වා එවා ඇති බැවින් ඔවුන් දෙදෙනාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා විසින් යෝජනා කිරීමෙන් හා ගරු උප සභාපති සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව එම නිවාඩු අනුමත විය.

**3.2. පානීය ජලය ලබා ගැනීම**

මිශ්‍ර බෝග ගොවි සංවිධානය තෙළඹුගහ අතුර,බඹරගල විසින් දැනට බඹරගල වසමේ දැනට ක්‍රියාත්මක ජල ව්‍යාපෘතිය වසමේ සියළු දෙනාට ලබා ගැනීමට හැකි පරිදි සාධාරණ මිලක් තීරණය කර දෙන මෙන් ඉල්ලා ගරු උප සභාපතිතුමා වෙත ලිපියකින් කර ඇති ඉල්ලීම ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**3.3. ලීකෙලිගම ප්‍රජා ශාලාව සඳහා සීට් ලබා ගැනීම**

දිවිනැගුම ප්‍රජා මූල සමිතිය විසින් ලීකෙලිගම ප්‍රජා ශාලාව සඳහා සීට් 20ක් ලබා දෙන ලෙස ඉල්ලා ගරු උප සභාපතිතුමා වෙත ලිපියකින් කර ඇති ඉල්ලීම ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**3.4. රණවිරු විජේපාල අනුස්මරණ පුස්තකාලයට පොත් ලබා ගැනීම**

සභාපති ,සුහද යෞවන සමාජය,හටංගල,බලන්ගොඩ විසින් ප්‍රතිසංස්කරණය කරන ලද රණවිරු අනුස්මරණ පුස්තකාලය දැනුමින් ශක්තිමත් කිරීමට අනුග්‍රහය ලබාදෙන ලෙස ඉල්ලා ගරු උප සභාපතිතුමා වෙත ලිපියකින් කර ඇති ඉල්ලීම ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

## 4. <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u>

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න කිසිවක් නොවීය.

## 5. <u>කල් දී ඇති යෝජනා</u>

### 5.1. ගරු සභාපති කැළුම් ප්‍රියංකර ජයසිංහ මැතිතුමා

I. බදු හා බලපත්‍ර ගාස්තු පැනවීම

149 දේශීය සභා පනතේදරණ ප්‍රා 15 අංක 1987,150(1),151,152)1) සහ (2යන උප වගන්ති ( දේශය ඇතුලත දේශීය සභා බල ප්‍රකාරව මෙම ප්‍රාදේශීය සභාවට පැවරි ඇති බලතල ප්‍රයටතේ ප්‍රා වර්ෂයට 2019 ගාස්තු හා බදුපාර වෙනුවෙන් බලපත්‍රකරගෙන යනු ලබන කර්මාන්ත ව්‍යා වන දිනට පෙර ගෙවිය යුතු 31 වර්ෂයේ මාර්තු 2019 ගාස්තු හා බදුඑකී බලපත්‍ර,පැනවීමටත් ගාස්තු හා බදු සභාව විසින් පනවා අය කරන බව රජයේ ගැසට් නිවේදනය මඟින් බලපත්‍ර,බවත් .කාශයට පත් කිරීමට සුදුසු බවත් යෝජනා කරන ලදීප්‍ර

**<u>ගාස්තුවෙළඳ බලපත්‍ර .(අ)</u>**

වර්ෂය ස 2019දහා ඇමුණුම මාණයන් වෙළඳ බලපත්‍රඋපලේඛනයෙහි සඳහන් අනුප්‍ර 01 ,කර්මාන්ත බදු පැනවීමටත්,පාර බදුව්‍යා,ගාස්තු

**ජල ගාස්තු (ආ)**

වන වගන්තිය යටතේ පළාත් පාලන විෂය 2 වස්ථාවේදරණ පළාත් පාලන අතුරු ව්‍ය 6 අංක 1952 1988 වරයා විසින් සම්පාදිතභාර අමාත්‍ය.08.520 වන දින අංක 23/ 7දරන ගැසට් පත්‍රයේ පල කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල 46 වන ජේදයේ 34(1) වගන්තිය සහ 2018.07. දින දරණ අංක 26 වස්ථාව මඟින් පැවරී ඇති බලතල යෙහි පළ කරණු ලැබූ සංශෝධන අතුරු ව්‍යගැසට් පත්‍ර 2082 පැළැන්දකන්, උතුරු හුණුවල ,ලියන්වින්න ,කාරව මෙම සභාව විසින් කන්දෙවිහාරප්‍රද සහ අඹගහවින්න ජල යෝජනා ක්‍රම සඳහා මෙහි ඇමුණුම මාණයන් මත ජල උප ලේඛනයේ සඳහන් ප්‍ර 2 ,වර්ෂය සඳහා පැනවීමත් 2019 ගාස්තුවක්

**රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද (ඇ)**

වන 148 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 147 දේශීය සභා පනතේදරණ ප්‍රා 15 අංක 1987 දේශීය සභාවට ලැබී ඇති බලතල වන උප ලේඛනයේ සඳහන් විධිවිධාන මඟින් ප්‍රා 4 වගන්තිය සහ වර්ෂයේදී පහත උප ලේඛනයේ 219 දේශය ඇතුලතදේශීය සභා බල ප්‍රකාරව මෙම ප්‍රාප්‍ර

වන තීරුවේ සඳහන් කිසිය 1ම් වාහනයක් තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුම එහි II වන තීරුවෙන් නිරූපිත බද්දක් ,වර්ෂය සඳහා පැනවීමටත් 2019

2. විශ්කම්භය අඟල් හුදෙක් පෞද්ගලික ,විල් බැරෝ, ක් නොයික්මවන රෝද සහිත ළමා වාහන 26 ස්ථාන වල කාර්ය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

3. ඉහත සඳහන් වන වෙළඳ කාර්ය යන්නට විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත්ය.

**වරිපනම් බදු (ඈ)**

දේශීය සභාදරණ ප්‍රා 15 අංක 1987පනතේ 134(I) වැනි වගන්ති ප්‍රකාරව වැලිගෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දියුණු කල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති පහත සඳහන් ප්‍රදේශ වල පිහිටි දේපල සඳහා වරිපනම් බදු පැනවීමට ගෙන ඇති තීරණය අනුව එකී සීමා ඇතුලත වර්ෂය 2019 සඳහා එක් එක් දේපල මත වාර්ෂික වටිනාකමින් සියයට හයක 6)%)වරිපනම් බද්දක් පැනවීමට තීරණය කර ඇත.2018 වර්ෂයට අදාල තක්සේරුව දරණ 15 අංක 1987 වර්ෂයට අදාල බවත් 2019 වන වගන්තියේ 146 දේශිය සභා පනතේප්‍රාI වන උප වගන්තියෙන් වැලිගෙපොල ප්‍රාදේශිය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම ප්‍රදේශය තුල ඇති වැලිගෙපොල) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (2014 වර්ෂයේ සිදුකරන ලද තක්සේරුව පිළිගැනීමට මෙයින් ප්‍රකාශ කරමි.

*2018.09.13 දින මාසික සභා රැස්වීම*

යථෝක්ත පනතේ ) වැනි වගන්තියේ 134Iකාර වැනි උප වගන්තියේ පැවරී ඇති බලතල ප්‍ර( ඕපනායක ,දේශීය ලේකම් කොට්ඨාශය තුලදේශයේ ඕපනායක ප්‍රාදේශීය සභා බල ප්‍රවැලිගෙපොල ප්‍රා හන්දියේ සිට බලන්ගොඩ පාර වරිපනම් අංක 71 සිට 1 විජයාරාම පාර වරිපනම් අංක, දක්වා 466 සිට 1 52 සිට 1 මිදැල්ලදෙනියගොඩ පාර වරිපනම් අංක, දක්වා 22 සිට1 බඩු ගබඩාව පාර වරිපනම් අංක , දක්වා පැල්මඩුල්ල පාර අවසාන වරිපනම් ඒකකයේ සිට,දක්වා 21 සිට 1 මොරවිට්වල පාර වරිපනම් අංක ,දක්වා වැලිගෙපොල ප්‍රාදේශීය සභා සීමාව දක්වා බලන්ගොඩ පාර අවසාන වරිපනම් ඒකකයේ සිට , උඩවෙල හන්දිය ආරම්භයේ සිට උඩවෙල පාසල් භූමිය , පල්ලෙකන්ද විදුහල අසළ ඇති බෝක්කුව දක්වා දෙල්ගස් හන්දිය ආරම්භයේ සිට මහින්දාරාම විහාරස්ථානය හරහා කිරඹ පන්සල පිහිටි ඉඩම ,දක්වා හුණුවල මැ,දක්වාටිහක්වල පාර ආරම්භයේ සිට ඉඹුල්තැන්න ගම්මානය අවසානය දක්වාඕපනායක , දේශීය සභා සීමාව අවසානය දේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩම ආරම්භයේ සිට වැලිගෙපොල ප්‍රාප්‍රා ගල්හිර හන්දිය ආරම්භයේ සිට ,කරගහයට හන්දිය ආරම්භයේ තාන්නෙහේන හන්දිය දක්වා ,දක්වා මිදෙල්ලගොඩ මාර්ගයට සම්බන්ධවන ස්ථානය දක්වාකන්දෙවිහාර පාර ආරම්භයේ සිට කන්දෙවිහාරය , ,හුණුවල පාලම ලඟ සිට පොල්බොක්ක පාලම දක්වා ද, පිහිටි ඉඩම දක්වා

වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩමේ සිට වැලිගෙපොල හන්දියේ ප්‍රධාන පාරට සම්බන්ධ වන ස්ථානය දක්වා වැලිගෙපොල හන්දිය , වැලිගෙපොල හන්දිය ආරම්භයේ සිට පල්ලෙබැද්ද පාර , දක්වා 500 ආරම්භයේ සිට හටංගල පාර මීටර් වැලිගෙපොල හන්දිය ආරම්භයේ සිට පාසැල් මාවත,දක්වා 500 මිටර් මීටර් 500ක් දක්වා ,අම්බැවිල හන්දිය ආරම්භයේ සිට රංවල පාර මීටර් 800 ක් දක්වා ,අම්බැවිල හන්දිය ආරම්භයේ සිට කුඩාව පාලම දක්වා,රංවල විදුහල පිහිටි ඉඩමේ සිට රංවල තැපැල් කාර්යාලය පිහිටි ඉඩම අවසානය දක්වා ,සඳගනාගම හන්දියේ සිට කෝන්ගස්තැන්න හන්දිය දක්වා.

ඉහතින් සඳහන් කර ඇති සෑම මාර්ගයකම මධ්‍යයේ සිට දෙපසට මීටර් බැගින් වරිපනම් සීමාව 100 මී , සලකනු ලබන බවටර් ක් ගණන් ගැනිමේදි යම් නිවසකින් හෝ ඉඩමකින් කොටසක් ඇතුළත් 100 මෙම දියුණු කළ ,වුවහොත් එම සම්පූර්ණ ඉඩම හෝ නිවස වරිපනම් සීමාවට ඇතුළත් සේ සළකන බවත් 6 ද්ශයේ සියලු නිශ්චල දේපලක වාර්ෂික වටිනාකමින්ප්‍රෙ% ක වරිපනම් බද්දක්ද වර්ෂය සඳහා 2014 ,පනවා අය කිරිමටත්

එකී පනතේ) වන වගන්තියේ 134 6 31 මාර්තු 2014 වැනි උප වගන්තියේ විධිවිධාන යටතේ ( ,සැප්තැම්බර් 30,හා දෙසැම්බර් දින වලින් අවසන් වන එක් එක් කාර්තුව තුළදි යථෝක්ත වරිපනම් 31 මුළු වාර්ෂික වරිපනම් බද්ද ජනවාරි මස ඇතුළත ,කින් ගෙවිමට විධාන කිරිමටත් 04 සමාන වාරික දේශිය සභාවවැලිගෙපොල ප්‍රා ,ක වට්ටමක් ලබා දීමටත් %10 ගෙවන්නේ නම්කරන්නීය.

**<u>අක්කර බදු (ඉ)</u>**

) වන වගන්තියේ 134 ෙද්ශිය සභා පනතේදරණ ප්‍රා 15 අංක 19873ෙද්ශිය වන උප වගන්තියෙන් ප්‍රා ( ඉහත කී පනතින් , ෙද්ශිය සභාව තුළ පිහිටියා වුදකාරව වැලිගෙපොල ප්‍රාසභාවට පැවරී ඇති බලතල ප්‍ර වන 135වගන්තියේ නියමය යටතේ අක්කර බදු නිදහස් කර නොමැත්තා වුදස්පීර හෝ නිතිපතා , , ගොවිතැනක් යටතේ වූ

500 අඩු නොවන විට රුපියල් 1 හෝ හෙක්ටයාර් 1 හෙක්ටයාර (අ).ට වැඩි සෑම 05 ක්ද හෙක්ටයාර 00 10 ඉඩමක් වෙනුවෙන් වැඩි වන සෑම හෙක්ටයාරයක් සඳහාම රුපියල්.වන වාර්ෂික අ, බැගින්ද 00ක්කර බද්දක් පනවා අය කිරිමටත්,

(ආ) ප්‍රාෙද්ශිය සභා පනතේ ) වන වගන්තියේ 1346උප වගන්තියේ විධිවිධාන යටතේ එකි වර්ෂයේ ( 31 මාර්තු, ජුනි 30, සැප්තැම්බර් ,කින්ගෙවිමටත් 04 යන දින වලට සමාන වාරික 31 හා දෙසැම්බර් 30

(ඊ) විවිධ වර්ගයේ අය කිරිම්

ඇමුණුම 3 උප ලේඛනය අනුව විවිධ වර්ගයේ අය කිරීම් සිදු කිරිමටත්,

විනෝද බදු (උ)

විනෝද බදු ආඥා පනතේ විස්තර කර ඇති පරිදි විනෝද කටයුතු සඳහා ඇතුල්වීම පිණිස අය 10 කරනු ලබන ගාස්තු වලින්% ක බද්දක් අය කිරිමටත්,

වාරක දැන්වීම් සඳහා ගාස්තුප්‍ර(ඌ)

වාරක දැන්වීම් ගාස්තුපහත සඳහන් කරුණු පරිදි ප්‍ර අය කිරිමටත්,

01.බිත්ති වාරක දැන්වීම් සඳහාතාප්ප උයෝගි කර ගන්නා ප්‍ර/ වර්ග අඩි ක් සඳහා 01 රු.25.00

02.ස්ථිර දැන්වීම් පුවරු සඳහා වර්ග අඩි ක් සඳහා 01 ` රු.100.00

03.රෙදි මඟින් කෙරෙන ප්‍රවාරක දැන්වීම් සඳහා ක් සඳහා 01 වර්ග (කටවුට්/බැනර්) රු.30.00

04.ඩිජිටර් මුද්‍රණ දැන්වීමක් සඳහා වර්ග අඩි ක් සඳහා 01 රු.50.00

ගාස්තුපරිසර ආරාක්ෂණ බලපත්‍ර (එ)

දරණ ජාතික පාරිසරික 47 අංක 1980 දරණ පනත් වලින් සංශෝධිත 59 අංක 1988 සහ 53 අංක 2000 1523 පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව අංක/ක් ජ 2008 දරණ වර්ෂ 16නවාරි " ය්දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රෙ 25ඇ "කොටසේ නියමිත ව්‍යාපෘති ලෙස ප්‍රකාශිත ඇමුණුම් අංක 04 සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරිම තික්ෂේප ප්‍ර,අලුත් කිරිම , ,කිරිම සහ අත්හිටුවීමටත්

)ඒගොඩනැගිලි ඉදි කිරිම සම්බන්ධයෙන් ගාස් (තු පැනවීම

21 ෙද්ශිය සභා පනතේ අංකදරණ ප්‍රා 15 අංක 1987,49,වැනි වගන්ති වලින් පැවරි ඇති බලතල 78 1988 කාරප්‍ර.08.520 අංක 23/ය්දර්න පළාත් පාලන අතිවිශේෂ ගැසට් පත්‍රෙ 7 ivකොටසේ ගරු (ආ) ) කාශයට පත් කරන ලදුවඇමතිතුමා විසින් ප්‍ර260 අධිකාරිය වන නිවාස හා නාගරික සංවර්ධන ආඥා ( 2014 තාරවපනතේ වගන්ති වලින් පැවරි ඇති බලතල ප්‍ර/01/දින සිට බල පැවැත්වෙන පරිදි 01 ෙද්ශිය සභා බලප්‍රාප්‍රදේශය සීමාව තුළ ගොඩනැගිලි ඉදි කිරිම සඳහා පහත අප ලේඛනයේ සඳහන් ගාස්තු අය කිරිමටත්,

ගොඩනැගිලි ඉදි කිරීම සඳහා පෙරසැරි ගාස්තු අය කිරිම

| ගෙබිම විශාලාත්වය ව.අ. | නොවාසික .රු( වර්ග අඩියකට) | වානිජ .රු( වර්ග අඩියකට) |
|---|---|---|
| වර්ග අඩි ට අඩු500 | 1.50 | 3.00 |
| වර්ග අඩි 501-1000 | 1.80 | 3.50 |
| වර්ග අඩි 1001-2000 | 2.00 | 4.00 |
| වර්ග අඩි 2001-3000 | 2.20 | 4.50 |
| වර්ග අඩි 3001-5000 | 2.70 | 4.75 |
| වර්ග අඩි 5001-7500 | 3.00 | 5.00 |
| වර්ග අඩි 7501-10,000 | 3.50 | 5.50 |
| වර්ග අඩි 10,ට වැඩි 000 | 4.00 | 6.00 |

තවද මෙම සභා සීමාව තුළ කරනු ලබන සියලු ඉදි කිරිම් සහ ගොඩනැගිලි ඉදි කිරිම සඳහා ගොඩනැගිලි ඉදිකිරිම් අයදුම්පත්‍රයක් සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතු බවත්.යෝජනා කරන ලදි ,

එම යෝජනාවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජීමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරිමෙන් සිසිර ජ්‍රේ .ජී. ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ බෙදීමක් නොමැති බැ , අනතුරුවවින් ඒකි යෝජනාව පරිදි ගාස්තු පැනවූ බව ගාස්තු පනවා ගැනිමට එකි හා බදු හා බලපත්‍රවර්ෂය සඳහා බදු සහ බලපත්‍ර 2019 .ය මඟින් නිවේදනය කිරිමටත් සභාවේ ඒකමතික අනුමැතිය ලැබිණිරජයේ ගැසට් පත්‍ර

II. බදු පැනවිම ගොඩනැගිලි / සභාව සතු ඉඩම් 2019

පැර , පෙළෙගෙවත්ත කඩකාමර (අ)ණි දුම්රිය පොළ පාරේ කඩකාමරය වත්මන් බදු මුදලට රු 10% කින් වැඩිකර එම බදු කරුවන්ට ලබා දීමටත්

| අනු අංකය | වර්ෂයේ බදු දෙන ලද දේපල 2009 | මාසික බදු 2018 මුදල | මාසික බදු මුදල 2019 |
|---|---|---|---|
| 1 | පෙළෙහෙවත්ත අංක 01 | 8963.99 | |
| 2 | පෙළෙහෙවත්ත අංක 02 | 3921.75 | |
| 3 | පෙළෙහෙවත්ත අංක 03 | 4164.52 | |

| | | | |
|---|---|---|---|
| 4 | පෙළෙහෙවත්ත අංක 04 | 5266.23 | |
| 5 | පෙළෙහෙවත්ත අංක 05 | 5695.82. | |
| 6 | පෙළෙහෙවත්ත අංක 06 | 1923.47 | |
| 7 | පැරණි දුම්රිය පාරේ අංක කඩ කාමරය 07 | 4651.75 | |
| 8 | ඕපනායක පොළ ඉදිරිපිට අංක කඩ 08 කාමරයට යාබද කොටස | 1389.41 | |
| 9 | පෙළෙහෙවත්ත අංක 09 | 1389.41 | |

ක්ව පැවැති බදු මුදල රු600 දක්වා කඩ කාමර සඳහා රු 08 සිට 01 ඕපනායක පොළට යාබද අංක (ආ) ,දක්වා වැඩි කිරිමටත් 2000

ක්ද 11200 ක්ද වැලිගෙපොල සතිපොළ අවම ලංසුව රු7100 ඕපනායක සතිපොළ අවම ලංසුව රු (ඇ) රංවල ජනසවි පොළඅවම ලංසුව රු ක්ද 5450 ක්ද ඕපනායක මාළු ලැල්ල අවම ලංසුව රු 1110 ක් ද 4000 ක්ද රංවල පොළ මාළු ලැල්ල අවම ලංසුව රු15550 වැලිගෙපොල මාළු ලැල්ල අවම ලංසුව රු .වසර සඳහා ටෙන්ඩර් කැඳවීම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී 2019 වන ලෙස

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති සමන්ජීවලාල් වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

ඉහත යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.සිසිර ප්‍රේම කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

2019 වර්ෂයට අදාලව බදු පැනවීම සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් වසන්ත කුමාර මැතිතුමා අදහස් පළ කරමින්, සභාව සතු දේපල බදු දීම සඳහා වසර ගණනාවකින් ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කර නොමැති වීම හේතුවෙන් අතුරු බදු දීම් සිදුවිය හැකි බැවින්,ඒවා විධිමත් කළයුතු බව පැවසීය.

එම අදහස් සම්බන්ධයෙන් කරුණු පැහැදිළි කල ගරු සභාපතිතුමා,ඕපනායක පොළ ඉදිරිපිට කඩ කාමර සහ පෙළගෙවත්ත ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගැනීම පිණිස තක්සේරු වාර්තා ලබා දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කල බවද,පෙළෙහෙවත්ත ඉඩම් සම්බන්ධයෙන් පිඹුරුපත් නොමැතිවීම මත තක්සේරුවක් ලබා නොදුන් අතරඕබනායක කඩ කාමර 1997 වර්ෂයේදී එකවර මුදලක් අයකරගෙන (Key mony) බදු කරුවන් තෝරාගෙන ඇති බැවින් බදු කුලී වශයෙන් මාසිකව ලබා ගත් රු .600/= ක මුදල වෙනුවට රු.2000/= ක නව තක්සේරුවක් ලබා දී ඇති බවට කරුණු අනාවරණය කළේය.එසේ වුවද රත්නපුර - බලන්ගොඩ මාර්ගය පුළුල් කිරීමේදී ඕපනායක කඩ කාමර පාරට මදක් පහත් වූ නිසා වෙළඳාම දුෂ්කර වී ඇති බැවින් එම මුදල අය කර ගැනීමේ දී ගැටළු පැන නැඟිය හැකි බවද වැඩි දුරටත් සඳහන් කලේය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.සී.ඉසුරුමුණි මැතිතුමා ව්‍යාපාර බදු සහ බලපත්‍ර ගාස්තු පැනවීමේ යෝජනාවට අදාල අදහස් ප්‍රකාශ කරමින්,එකී යෝජනාවේ සඳහන් බදු අනුප්‍රමාණයන් ලාභ ලබන ව්‍යාපාර, කර්මාන්ත සම්බන්ධයෙන් ප්‍රමාණවත් නොවන බවත් ,මහජන සුභ සිද්ධිය සඳහා ඵලදායි සේවාවක් ඉටුකිරීමට ආදායම් අයකර ගත යුතු බැවින් ,බදු හා බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් පනතේ නිරූපිත බද්දෙහි උපරිම සීමාව කාලෝචිතව වෙනස් විය යුතු බව සඳහන් කලේය. විශේෂයෙන් ,

1. ගල්වලක් පවත්වාගෙන යාම

2. යාන්ත්‍රික වඩු කම්මලක් පවත්වා ගැනීම
3. කණිජ තෙල් අලෙවි සැළක් පවත්වා ගෙන යාම
4. මනාලියන් හැඩගැන්වීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
5. භෝජන ශාලාවක් පවත්වාගෙන යාම
6. නේවාසික පහසුකම් සහිත හෝටලයක් පවත්වාගෙන යාම
7. කුකුල් කොටුවක් පවත්වාගෙන යාම
8. පළතුරු විකිණිම
9. පරණ යකඩ මිලට ගෙන විකිණීම

වැනි විෂයන් වලට අදාල ව්‍යාපාරික ප්‍රජාව ලාභ ලබන බැවින් බද්ධෙහි උපරිම සීමාව කාලෝචිතව සංශෝධනය විය යතු බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා බදු අනුප්‍රමාණයන් වැඩි කිරීම සම්බන්ධ යෝජනාවක් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කල යුතු බව ප්‍රකාශ කළේය.මෙම කරුණ සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න,ඩී.බුද්ධික වීරසිංහ යන මන්ත්‍රීවරුන්ද අදහස් පල කර සිටින ලදී.ඒ අනුව මෙම සභා බල ප්‍රදේශය තුල ජනතාව සේවා අවශ්‍යතා සඳහා බළන්ගොඩ,පැල්මඩුල්ල සහ පල්ලෙබැද්ද වැනි නගර කරා ඇදී යාම නිසා බල ප්‍රදේශය ඇතුළත වෙළඳසැල තත්වයන් පහත වැටී ඇති බවට කරුණු අනාවරණය විය.

සභා බල ප්‍රදේශය තුල අයකර ගත හැකි නව ආදායම් ක්‍රමෝපායන් සම්බන්ධයෙන් දැනටමත් සභාවේ අවධානය යොමුකර ඇති බවත්,ඒ අනුව ත්‍රීරෝද රථ නවතා තැබීම විධිමත් කිරීම හා පාලනය කිරීමේ අතුරු ව්‍යවස්ථා,වාහන වල බර සහ වේග සීමා කිරීමේ අතුරු ව්‍යවස්ථා හා ජල සම්පාදන අතුරු ව්‍යවස්ථාව දැනටමත් සම්මත කර ඇති බවත් ,ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා සම්පාදනය තුලින් නව ආදායම් මාර්ග හඳුනාගෙන නීතිමය ප්‍රතිපාදන මත ඒවා අයකිරීමට ක්‍රියාකරන බව මෙහිදී ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දීමෙන් අනතුරුව ඉහත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපතිතුමා විසින් පහත යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී.

III. මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ උඩවෙල ග්‍රාම නිලධාරී වසමට අයත් ගැටනගොඩ මාර්ගයක් අත්පත්කර ගැනීම සුදුසු බව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

IV. ප්‍රාදේශීය සභාවේ පොදු මුද්‍රාව අපහැදිළි වූ බැවින් නව මුද්‍රාවක් සකස් කිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිසිර ප්‍රේම කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම පළාත් පාලන ආයතනය සංස්ථාපනය කරන අවස්ථාවේදී සකස්කරන ලද පොදු මුද්‍රාවේ පවතින සංකේත මැකී ඇති බැවින් සභාවේ අනන්‍යතාවය සඳහා එය සංශෝධනය කර සැකසීමේ අවශ්‍යතාවය ගරු සභාපතිතුමා විසින් සභාවට පැහැදිලි කර දීමෙන් අනතුරුව ඉහත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

V. 2009 වර්ෂයට අදාලව මාළු ලැලි වලින් අයවිය යුතු එහෙත් අයකර ගත නොහැකිව ලේඛන ගතව ඇති රුපියල් 5050/= ක මුදල බදු කුලී ලේඛනයෙන් කපා හැරීම සුදුසු බව යෝජනා කරන ලදී. එ

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී අචිනි එස්.අබේවික්‍රම මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙම මුදල අය නොවීම සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා කරුණු විමසා සිටි බැවින් ඒ සඳහා කාර්ය මණ්ඩලයේ පිළිතුරු අපේක්ෂාවෙන් ගරු සභාපතිතුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.(වෙලාව පෙ.ව.11.20)

ඒ අනුව සභාවේ ලේකම් එස්.රත්නාවතී මැණිකේ මෙනවිය විසින් 2009 වර්ෂයේදී ඕපනායක මාළු ලැල්ල බදු දීම සඳහා සුදුසුම පුද්ගලයා ලෙස ....................මයා හඳුනාගෙන ඇති බවත්,බදු කුලී ලේඛනයේ ඔහුගේ නමින් නොගෙවී ඉදිරියට පවතින හිඟ ශේෂය බදු කරු විසින් මෙම මුදල ගෙවිම පැහැර හැර  ඇති බවත්,තහවුරු වි ඇති බවත්, මෙම මුදල අය කර ගැනිම සඳහා විටින් විට වාර්ෂිකවත්, ලිඛිතවත් දැනුම් දිම් සිදු කලද මෙම මුදල සභාවට ගෙවිම සඳහා ඉහත බදු කරු අපොසත් වි ඇති බවත් ප්‍රකාශ කළාය.
ඒ සම්බන්ධයෙන් නීතිමය පියවරක් ගැනිමට ඇති හැකියාව සම්බන්ධයෙන් සොයා බැලිමේදී ආදාළ ලිපි ගොනුවේ "ගිවිසුම" නොමැති විම ඝාට බාධාවක්ව පැවතිම වි හේතුවෙන් එම උත්සහායද අසාර්ථක වු බැවින් නිරතුරුව විගණන විමසුමට ලක් වන ඉහතින් සඳහන් කරන ලද රු 5050ක මුදල කපා හැරිමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනිම පිණිස පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කිරිමට අවශ්‍ය බවත් ප්‍රකාශ කිරිමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් කාරක සභාව මහ සභාවක් බවට පත් කරන ලදී. .(වෙලාව පෙ.ව.11.25)

සභාවට අයවිය යුතු ආදායමකත් මෙලෙස මඟ හැරිම යාම සම්බන්ධයෙන් තවදුරටත් සභාවේ කථාබහට ලක් වු අතර කිසියම් මුදල් නොගෙවී ලේඛණ ගත වී තිබිම සභාවේ මූල්‍ය කාර්යය සාධනයට බලපෑම් ඇති කර ඇති බැවින් ඉහත යෝජනාවට සභාවේ ඒකමතික අනුමැතිය පළ විය.

## VI. ගරු සභාපතිතුමාගේ හදිසි යෝජනා.

(අ) ඔක්තෝබර් මාසයට යෙදී ඇති ජාතික කියවීම් මාසයේ වැඩසටහන් ඉදිරිපත් කල යුතු බැවින් පහතින් දැක්වෙන වැඩසටහන් සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එච්.සිරිපාල මැතිතුමා විසින් ස්ථිර කිරිමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

(ආ) වැලිගෙපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඕපනායක නගරය ආශ්‍රීතව ගිමන්හලක් ඉදි කිරිම සුදුසු බව යෝජනා කරන ලදී.
එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. රෝහණ විජේරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් ඕපනායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වෙන් වී ඇති රු මිලියන 4ක මුදල ගිමන් හරින ස්ථානයක් ස්ථාපනය කිරිමට යෙදවීම සඳහා යෝජිතව ඇති බවත් අදාළ ඉදි කිරිම් කටයුතු වලින් පසුව එහි අයිතිය සභාවට පවරා දිමට නියමිත බවත් ප්‍රකාශ කල ගරු සභාපතිතුමා ඒ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඕපනායක පොලිස් ස්ථානයට යාබදව ඇති සභාව විසින් තුරු උයනයක් ලෙස භාවිතා කරන බිම් කොටස හෝ ඕපනායක ප්‍රජාමණ්ඩලීය පෙර පාසල් භූමිය උපයෝගි කර ගත හැකි බව ප්‍රකාශ කළේය.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ. රෝහණ විජේරත්න මැතිතුමා විසින් සිය අදහස් පළ කරමින් ඕපනායක තුරු උයන සහිත බිම් කොටස ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිත නගර අලංකරණයට සුදුසුම බිම් කොටස වන බැවින් එම ස්ථානය උපයෝගි කර ගන්නා ලෙස ඉල්ලා සිටියේය. ප්‍රජා මණ්ඩලීය පෙර පාසල පිහිටි ඉඩම මෙම කාර්යය සඳහා යොදා ගන්නේ නම් පෙර පාසල පවත්වා ගෙන යාමේ ගැටළුවක් පවතින බවත් ගිමන් ගන්නා ස්ථානයකට වඩා ඉන්ධන පිරවුම් හලක් හෝ වෙනත් කාර්යයකට එම බිම් කොටස සුදුසු බැවින් වඩාත් ඵලදායි ස්ථානයක් සැලසුම් සහගතව තීරණය කල යුතු බව පැවසීය.

ඉහත අදහස් දැක්වීම අනුව ගරු සභාපතිතුමා සභාව අමතමින් පළාත් පාලන ඉංජිනේරු මහතා ස්ථානීය පරික්ෂාවක් සිදු කර ඉහත කාර්යයට වඩාත්ම සුදුසු ස්ථානය පිළිබඳව නිගමනයකට එළඹීමට තීරණය නිරීමෙන් පසු එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## 5.2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී පී.ආර්.එස්. ධම්මිකා මැතිතුමිය

ගරු මන්ත්‍රීතුමිය විසින් පහත සඳහන් යෝජනා සභාවට ඉදිරිපත් කරන ලදී

I. **යටිපස්ගමුව දෙනිය පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය බවත් ,**

II. **යටපස්ගමුව තලගහ ඇල්ල බස් නැවතුමට වීදී ලාම්පුවක් සවිකිරීම** සුදුසු බවත්,

III. **යටපස්ගමුව පුබුදු පෙරපාසලට අවශ්‍ය ලිස්සන බෝට්ටුවක් සාදා දෙන ලෙසත්,** යෝජනා කරන ලදී.

ඉහත යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඒ.ඩබ්ලිව්. සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ගරු මන්ත්‍රීතුමියගේ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

## 5.3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි. සමන්ජීව මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.අයි. සමන්ජීව මැතිතුමා අද දින නිවාඩු ලබාගෙන ඇති බැවින් එතුමා විසින් න්‍යාය පත්‍රයට ඇතුලත් කර ඇති පහත සඳහන් යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

ජී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.බුද්ධික විරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

I. තලගස්කන්ද ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම හා සභාවට පවරා ගැනීම සුදුසු බවත්,
II. තුඹගහවෙල බෝක්කුවේ වැඩ කටයුතු කඩිනම් කිරීම අවශ්‍ය බවත්,
III. මැදගංඔය මාර්ගය දෙපස කාණු පද්ධතිය සැකසීම අවශ්‍ය බවත්,
IV. ගරා වැටී ඇති තලගස්කන්ද, උඩතලගස්කන්ද, මැදගංඔය හංදිය, යපල් ආර බස් නැවතුම්පොලවල් ඉදි කිරීම සුදුසු බවත්,
V. වීථි ලාම්පු සියල්ල අක්‍රිය වී ඇති බැවින් සියල්ල සැකසීම අවශ්‍ය බවත්, යෝජනා කරන ලදුව ,ඉහත යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

## 5.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩීසිරිපාල මැතිතුමා.එච්.

I. හල්ලින්න අළුදෙනිය මාර්ගය සංවර්ධනය කිරීම අවශ්‍ය බවත්,
II. ඉදිරිමිණිකන්ද මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
III. මල්මීකන්ද දුනුකාරගොඩ මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
IV. තලගහවත්ත මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම අවශ්‍ය බවත්,
V. ගල්ලෙනකන්ද මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රීට් කිරීම සුදුසු බවත් යෝජනා කරන ලදී.

ගරු මන්තීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී. සිසිර ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසුව සභා සම්මත විය.

## 5.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඒ ඩබ්ලිව් සුමනාවතී.මැතිතුමිය

I. තලවත්ත එච් .ඒ.ගාමිණී කුලතුංග මහතාගේ නිවස අසල සිට එම්නිරෝෂා කුමුදුනී .ජී. තිසංස්කරණය මහත්මියගේ නිවස දක්වා ඇති රජයෙන් වෙන් කරඇති මාර්ගය ප්‍ර කිරීම අවශ්‍ය බවත්,
II. අස්සැද්දුම ජිනදාස මහතාගේ නිවස අසල ඇති ඇළ මාර්ගය හරහා වැටී ඇති මාර්ගයට කුඩා බෝක්කුවක් සහිතව මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම අවශ්‍ය බවත්,

යෝජනා කරන ලදුව එම යෝජනා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එල්.ඒ. ගුණතිලක මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

## 5.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් රෝහණ විජේරත්න. ඒ.මන්ත්‍රිතුමා

I. පොල්බොක්ක මාර්ගයේ චමිත් මහතාගේ නිවස අසල ඇති බෝක්කුව අබලන් වී ඇති බැවින් නව බෝක්කුවක් ලබාදීම අවශ්‍ය බවත්,

II. අළුදෙනිය මාර්ගය අබලන් වී ඇති බැවින් සංවර්ධනය කිරීම සුදුසු බවත්,

III. පහලවෙල මාර්ගය සංවර්ධනය කිරීම අවශ්‍ය බවත්,

IV. අළුදෙනිය ජගත් මහතාගේ නිවසට යන මාර්ගය අලස වීථි පහනක් සවි කිරීම අවශ්‍ය බවත්,

V. පොල්බොක්ක මාර්ගයේ චන්ද්‍රප්‍රේම මහතාගේ නිවස ඉදිරිපිට ඇති පැති බැම්මට යාබදව ඇති කාණුව වසා දැමීම සුදුසු බවත්,

VI. නව ගම්මානයට ක්‍රීඩා පිටියක් ඉදි කිරීම සුදුසු බවත් ,ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනා ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඒ.ඩබ්ලිව්. සුමනාවතී මැතිතුමිය විසින් ස්ථිර කිරීමෙන් පසු සභා සම්මත විය.

.

## 6. <u>කාරක සභා වාර්තා සලකා බැලීම.</u>

## 6.1. 2018.08.08 හා 2018.09.07 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටු වාර්තාව

2018.08.08. හා 2018.09.07 දින පැවති කාරක සභාවේ අංක 131-199 දක්වා වූ වියදම් මහ සභාවේ සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදී.

## 6.2. 2018.08.02 දින ප්‍රසම්පාදන වාර්තාව

වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් උපකරණ ලබාගැනීම සඳහා 2018.08.02 දින ප්‍රසම්පාදන කමිටුව රැස් වන ලදී.

01. වරිපනම් අංශයට පරිගණකයක් මිලදී ගැනීම

02. වීථි පහන් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය උපකරණ ලබාගැනීම

03. ගරු මන්ත්‍රී වරුන් සඳහා ලිපි ශීර්ෂ පොත් සෑදීම

ඉහත සඳහන් උපකරණ ලබාගැනීමට ලැබුණ ඉල්ලීම පරිදි මා විසින් මිළ ගණන් ලබාගත් අතර ලැබුන මිළ ගණන් හා එහි විස්තර එක් එක් උපකරණ සඳහා පහත පරිදිවේ.

01.පරිගණකයක් මිලදී ගැනීම

| අනු අංකය | ඉදිරිපත් කළ ආයතනය | පරිගණකය පිලිබද විස්තර | නිෂ්පාදිත රට හා වගකීම් කාලය | මිල |
|---|---|---|---|---|
| 01 | Imago Computers - Ratnapura | Dell Vostro 3669 i3 | USA 03 years | Rs.79450.00 |
| 02 | E-Wis Information Systems-Colombo-03 | E-Wis Pro 2700 | Sri Lanka 03 Years | Rs.91300.00 |
| 03 | Sri Lanka State Trading Corporation – Colombo-02 | HP Pro Desk 280 G 3 | USA 03 Years | Rs.92300.00 |
| 04 | NUNET Computers – Ratnapura | Dell Vostro 3669 | USA 03 Years | Rs.79000.00 |
| 05 | NEC Technologies – Ratnapura | Acer Veriton ES2710G | Taiwan 03 Years | Rs.82500.00 |
| 06 | PC Systems – Balangoda | Dell Vostro 3669<br>Acer Ves2710 | 3 Years<br>3 Years | Rs.80500.00<br>Rs.78900.00 |
| 07 | PC Globe Systems –Colombo-06 | HP Pro Desk 280 | USA 03 Years | Rs.89900.00 |

*2018.09.13 දින මාසික සභා රැස්වීම*

මෙදින රැස්වූ ප්‍රසම්පාදන කමිටුව ඒකමතිකව තීරණය කරනු ලැබුවේ ඉහත සදහන් මිල ගණන් බලංගොඩ නගර සභාවේ තොරතුරු තාක්ෂණ නිලධාරී සංකල්ප පේමදාස මහතාට ඉදිරිපත් කර වැලිගෙපොල ප්‍රාදේශීය සභාවට සුදුදු පරිගණකයක් ඉහත ආයතන අතරින් තෝරාගැනීම සුදුසු බවයි.

02. වීථි පහන් උපකරණ ලබාගැනීමේ මිල ගණන් වල විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | අවශ්‍යා ද්‍රව්‍ය | ප්‍රමාණය | මිල ගනන් හා ආයතන | | |
|---|---|---|---|---|---|
| | | | රූබසිංහ හාඩ්වෙයාර්-දෙල්ගස්හන්දිය | සදීෂ එන්ටර්ප්‍රයිස්-මල්මීකන්ද | ප්‍රදීපා ඉලෙක්ට්‍රිකල්ස්-ඇඹිලිපිටිය |
| 01 | C FL බල්බ් 23W | 100 | රු.58000.00 | රු.50000.00 | රු.50000.00 |
| 02 | 1 ගැන් ස්විච් | 50 | රු.6750.00 | රු.6500.00 | රු.6000.00 |
| 03 | සන් බොක්ස් | 50 | රු.1250.00 | රු.1250.00 | රු.1750.00 |
| 04 | ටේප් රෝල | 06 | රු.360.00 | රු.360.00 | රු.360.00 |
| 05 | වයර් රෝල්(1.44) | 30 | රු.8250.00 | රු.8250.00 | රු.8000.00 |
| 06 | ලොකු අල්ලු | 10 | රු.14700.00 | රු.14400.00 | රු.16500.00 |
| 07 | 250වොට් සෝඩියම් බල්බ් | 10 | රු.18700.00 | රු.18500.00 | රු.19500.00 |
| 08 | 250 වොට් කණ්ඩෙන්සර් | 12 | රු.8200.00 | රු.8000.00 | රු.8750.00 |
| 09 | 250 වොට් චෝක් | 20 | රු.20880.00 | රු.20760.00 | රු.- 23400.00 |
| 10 | 250 වොට් ත්‍රී පින් බල්බ් | 30 | රු.11500.00 | රු.11000.00 | ------- |
| 11 | බණ්ඩල් ටැප් | 20 | රු.5400.00 | රු.5100.00 | රු.8250.00 |
| 12 | හෝල්ඩර් (ස්කෘ) | 05 | රු.2000.00 | රු.1800.00 | රු.2400.00 |
| 13 | ස්කෘ බල්බ් | 10 | රු.5750.00 | රු.5750.00 | රු.5000.00 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | මුලු මුදල | | රු.161740.00 | රු.151670.00 | රු.149910.00 |

ඉහත මිල ගණන් අනුව සියලුම වීරී පහන් උපකරණ හා අවම මිල ඉදිරිපත් කර ඇති සදිශ එන්ටර්ප්‍රයිස් වෙතින් අවශ්‍ය උපකරණ රු.151670.00ක මුදලකට ලබාගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කරණලදී.

3. ලිපි ශීර්ෂ පොත් සාදවා ගැනීමට අදාල මිල ගණන් පිළිබද විස්තර

| අංකය | අවශ්‍ය ද්‍රව්‍ය | මිල ගනන් හා ආයතන | | |
|---|---|---|---|---|
| | | කරුණාරත්න ප්‍රින්ටර්ස්- බලංගොඩ | පුන්සද ප්‍රින්ටර්ස්- බස්නැවතුම්පල බලංගොඩ | අරුණ ප්‍රින්ටර්ස්- උඩවෙල |
| 01 | ලිපි ශීර්ෂ පොත් 60ක් සෑදීම සදහා මිල ගණන් ලබාගැනීම | රු.400x60<br>රු.24000.00 | රු.450x60<br>රු.27000.00 | රු.350x60<br>රු.21000.00 |
| | මුළු මුදල | රු.24000.00 | රු.27000.00 | රු.21000.00 |

මෙම කාර්යාලයේ ගරු මන්ත්‍රීවරුන් සදහා ලිපි ශීර්ෂ පොත් 60ක් සෑදීමට ලබාගත් මිල ගණන් අතුරින් අවම මිල ඉදිරිපත් කරඇති උඩවෙල අරුණ මුද්‍රණාලයෙන් රු.21000.00ක් වැය කර සාදවා ගැනීමට ප්‍රසම්පාදන කමිටුව තීරණය කරණ ලදී.

## 7. ආදායම් වියදම් වාර්තා

### 7.1. 2018.ජූලි මස ආදායම් වියදම් වාර්තාව

| ලැබීම් සාරාංශය | (රුපියල්) | වැය සාරාංශය | (රුපියල්) |
|---|---|---|---|
| වරිපනම් බදු | 628,570.91 | වැටුප් හා දීමනා | 2,457,873.29 |
| කුලී | 70,048.37 | ගමන් වියදම් | 7,326.00 |
| බලපත්‍ර ගාස්තු | 20,008.00 | සැපයුම් හා උපකරණ | 629,416.00 |
| සේවා සඳහා ගාස්තු | 139,103.80 | ප්‍රාග්ධන වත්කම්අළුත්වැඩියා හා නඩත්තුව | 180,546.41 |
| වරෙන්තු ගාස්තු | 885,661.94 | ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 61,998.33 |
| වෙනත් ආදායම් | 17,087.24 | පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | - |
| වෙනත් ආධාර | 2,178,891.83 | ආධාර මුදල් දායක මුදල් සහනාධාර | - |
| පුනරාවර්ථන ආදායම් එකතුව | 3,939,372.09 | විශ්‍රාම වැටුප්,විශ්‍රාම ප්‍රතිලාභ,හා පාරිතෝෂික | 17,374.56 |
| මූලධන ලැබීම් | - | පුනරාවර්තන වියදම් එකතුව | 3,354,534.59 |
| ප්‍රාග්ධන ආදායම් එකතුව | - | ප්‍රාග්ධන වැය | - |
| පුනරාවර්ථන ප්‍රාග්ධනආදායම් එකතුව | 3,939,372.09 | ණය ආපසු ගෙවීම් | - |
| සේවක ණය | 106,777.78 | සේවක ණය | - |
| තැන්පත් | 48,367.55 | තැන්පත් | 53,191.45 |
| අත්තිකාරම් | 11,000.00 | ණයහිමි | 5,000.00 |
| ණය ගැති(කර්මාන්ත) | - | අත්තිකාරම් | 20,000.00 |
| වෙනත් ලැබීම් එකතුව | 166,145.33 | ජල ගබඩා | - |
| | | ගබඩා(ඖෂධ) | - |
| | | සමුච්චිත අරමුදල | - |
| | | වෙනත් ගෙවීම් | |
| | | වෙනත් ගෙවීම් එකතුව | 78,191.45 |
| මුළු එකතුව | 4,105,517.42 | මුළු ගෙවීම් | 3,432,726.04 |

## 7.2. <u>2018 ජූලි 31 දිනට ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තා</u>

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.07.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | වරිපනම් බදු 1.11 | 4703281 | 1940000 | **230108** | **5%** | **627138** | **32%** | **1312862** | 4473173 |
| 2 | අක්කර බදු 1.12 | 71142 | 20900 | **8106** | **11%** | **5741** | **27%** | **15159** | 63036 |
| 3 | සැපයුම් කරුවන් ලියාපදිංචි නිරීම1.43 | | 125000 | | | **120125** | **96%** | **4875** | |
| 4 | ව්‍යාපාර බදු 2.16 | | 255000 | - | | **250800** | **98%** | **4200** | |
| 5 | වෙළෙඳ බලපත්‍ර ගාස්තු2.31 | | 730000 | - | | **803000** | **110%** | **(73000)** | - |
| 6 | පරිසර බලපත්‍ර ගාස්තු2.37 | | 30000 | | | **7500** | **25%** | **22500** | |
| 7 | ලියාපදිංචි සහතික හා පරීක්ෂණ ගාස්තු | | 458000 | | | **100627** | **22%** | **357373** | |
| 8 | ජල ගාස්තු 4.14 | 1868941 | 6075000 | 1365193 | **73%** | **2440429** | **40%** | **3634571** | 503748 |
| 9 | විකුණුම් | | 497000 | | | **97213** | | | |
| 10 | යන්ත්‍ර කුළියට දීම3.25(2)/3.25(3) | | 1050000 | | | **97550** | **9%** | **952450** | |
| 11 | වාහන නැවතුම්පල ගාස්තු 5.43 | | 300000 | | | | **0%** | **300000** | |
| 12 | ගොඩනැඟිලි බලපත්‍ර3.43(4) | | 250000 | | | **57512** | **23%** | **192488** | |
| 13 | පොදු වෙළඳපල | | | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කුළී | | | | | | | | |
| 14 | මස්කඩ මාළු කඩ කුලී 5.23(2) | 178393 | 428000 | 108861 | **61%** | **51800** | **12%** | **376200** | 69532 |
| 15 | ප්‍රමාද ගාස්තු | | 110000 | | | **36405** | **33%** | **73595** | |
| 16 | විනෝද බදු 6.15 | | 1000 | | | **-** | **0%** | **1000** | |
| 17 | සතිපොළ ගාස්තු5.23(1) | 25880 | 254000 | 5000 | **19%** | **142390** | **56%** | **111610** | 20,880.00 |
| 18 | නිවාස කුලී | | | | | | | | |
| 19 | දැන්වීම් පුවරු ගාස්තු1.37 | | 400000 | | | **408000** | **102%** | **(8000)** | |
| 20 | ජල බවුසරය කුළියට දීම 4.25 | | 300000 | | | **75100** | **25%** | **224900** | |
| 21 | ක්‍රීඩා පිටිය කුලියට දීම 6.25 | | 2000 | | | **0** | **0%** | **2,000** | |
| **22** | වෘත්තීය බලප 1.33 | | **100** | | | **-** | **0%** | **100** | |
| **23** | පොලී ආයෝජන 1.61 | | **500** | | | | **0%** | **500** | |
| **24** | සේවක ණය පොලී1.64 | | **40000** | | | **27728** | **69%** | **12272** | |
| **25** | අයකර ගතහැකි ගාස්තු2.43 | | **25000** | | | **3150** | **13%** | **21850** | |
| **26** | සභාව සතු ගොඩනැගිලි3.25.1 | | **1000** | | | **1,500.00** | **150%** | **(500)** | |

| අනු අංකය | ආදායම් ප්‍රභවය | **2017.12.31 ට හිඟ** | **2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම** | **2018.07.31** දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| **27** | දඩ අනවසර ඉදිකිරීම් 3.52 | | **500** | | | **-** | **-** | **500** | |
| **28** | අය කර ගත හැකි ගාස්තු 4.43 | | **1000000** | | | **583000** | **58%** | **417000** | |
| **29** | විශේෂ සැපයුම් සඳහා ගාස්තු4.16 | | **5000** | | | **-** | **-** | **5000** | |
| **30** | පොළ භූමිය කුලියට දීම5.25 | | **1000** | | | **300.00** | **0.30** | **700** | |
| **31** | ක්රීඩා පිටි ටකරන් මඩු කුලියට දීම6.25 | | **2000** | | | **0** | **0%** | **2000** | |
| | **වෙනත් ආදායම්*** | **15279** | **878140** | **15279** | **100%** | **354122** | **40%** | **524018** | |
| | **මුළු එකතුව** | **6837036** | **15179140** | **1732547** | **25%** | **6291131** | **41%** | **8488222** | **5130369** |

වවෙනත් ආදායම්*

| අනු අංකය | ආදායම් ප්‍රභවය | 2017.12.31 ට හිඟ | 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | 2018.07.31 දිනට හිඟයන් එකතු කළ ප්‍රමාණය | | මෙම වර්ෂයේ ඇස්තමේන්තුගත මුදලෙන් එකතු කල | | අයකිරිමට ඇති ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | මුදල රු. | ප්‍රතිශතය | මුදල රු. | ප්‍රතිශතය | ඇස්තමේන්තුගත ආදායමෙන් | හිඟයන් |
| 1 | ලියාපදිංචි කිරීමේ සහතික හා පරීක්ෂණ ගාස්තු | | | | | | | | |
| 2 | ඉඩම් හා ගොඩනැගිලි බදු දීම් | | | | | | | | |
| 3 | පා පැදි බලපත්‍ර 1.35 | | 150 | | | 8.00 | 5% | 142 | |
| 4 | වරිපනම් සංශෝධන ගාස්තු | | | | | | | | |
| 5 | වැසිකළි කුලියට දීම | | | | | | | | |
| 6 | කසල ඉවත් කිරීමේ ගාස්තු 2.13 | 5000 | 107000 | 5,000.00 | 1.00 | 34,000 | 32% | 73000 | - |
| 7 | සභා භූමිය කුලියට දීම | | | | | | | | |
| 8 | පාරවල් පළුදු වීම වෙනුවෙන් ගාස්තු | | | | | | | | |
| 9 | නොපවරවා ගැනීමේ සහතික ගාස්තු 3.43.(1) | | 200000 | | | 35000 | 18% | 165000 | |
| 10 | පුස්තකාල සේවා ගාස්තු 6.43 | | 15000 | | | 3070 | 20% | 11930 | |
| 11 | පුස්තකාල දඩ 6.52 | | 20000 | | | 3359 | 17% | 16,641 | |
| 12 | ඉඩම් විකිණීම මත බදු | | | | | | | | |
| 13 | ඉඩම් බදු 3.24 | 10279 | 448390 | 10279 | 100% | 232385 | 52% | 216005 | - |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **14** | වෙළෙඳ ස්ථාන කුලී03.22 | | **87600** | | | **46300** | **53%** | **41,300.0** | |
| | එකතුව | **15279** | **878140** | **15279** | **100%** | **354122** | **40%** | **524018** | - |

## 8. .පසුගිය සභා රැස්වීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

පසුගිය සභා රැස්විමට ඉදිරිපත් වූ යෝජනා විෂය නිලධාරීන් වෙත යොමුකර ඇති බවත්, 2018.05.03 දින සභා රැස්වීමේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී.යූ.ඩබ්ලිව්.කුමාර මැතිතුමා විසින් අනාවරණය කල කරුණු අනුව දෙල්ගස් හංදියෙන් ආරම්භ වන ගල්කන්ද මාර්ගය හා කට්ටංගේ මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධව පැල්මඩුල්ල විදායක ඉංජිනේරු වෙත අංක වැ/ප්‍රා/ස/අයි/10/03 හා 2018.06.01 දිනැතිව යොමු කරන ලද ලිපියට 2018.07.10 දිනැතිව අදාල කටයුතු සිදුකර ඇති බව දන්වමින් පිළිතුරු ලිපියක් එවා ඇති බව ගරු සභාපතිතුමා විසින් සඳහන් කරන ලදී.

## 9. <u>වෙනත් කරුණු</u>

### 9.1. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී. බුද්ධික වීරසිංහ මැතිතුමා

I. විශේෂයෙන් කෘෂි ආර්ථික රටාවක හුරු වූ ජන කොටසක් වෙසෙන මෙම ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ රංවල , වැලිගෙපොල ප්‍රදේශ වල සමූහ වශයෙන් රිලවුන් ගැවසීම නිසා වගා හානි බහුල වශයෙන් සිදු වන බව ට කරනු අනාවරණය කළ ගරු මන්ත්‍රීතුමා,එම ප්‍රදේශ වල කෙසෙල්,පොල් වැනි බෝග වගාවන් සම්පූර්ණයෙන්ම විනාශයට පත් ව ඇති බව ප්‍රකාශ කළේය.අනතුරුව මෙම තත්ත්වය නිසා එම ප්‍රදේශවාසින්ගේ ජන ජීවිතයට විශාල තර්ජනයක් එල්ලවි ඇති බැවින්,රිලවුන් පලවා හැරිම සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයක් ගන්නා මෙන් වනජීවි දෙපාර්තමේන්තුවට දන්වා යවන ලෙස එතුමා ඉල්ලා සිටියේය.

II. ර/මහඹිමාර විද්‍යාලය ළගම පාසල හොදම පාසල ව්‍යාපෘතියට ඇතුලත් කර ගැනිම සම්බන්ධයෙන් ප්‍රදේශවාසින්ගේ දැඩි පැසසුමට ලක් වුවත් එම ව්‍යාපෘතිය යටතේ ආරම්භ කරන ලද වැසිකිළි පද්ධතිය ඉදි කිරිමේ කටයුතු නතර වී ඇති බව සඳහන් කල ගරු මන්ත්‍රීතුමා, එම ව්‍යාපෘතියේ වැඩ නතර විම නිසා ගුරු -සිසු දෙපිරිසම අපහසුතාවයට ලක් ව ඇති බවත්, මෙම කරුණ සම්බන්ධයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ සහ කළාප අධ්‍යාපන අධක්ෂතුමාගේ අවධානයට යොමු කරන ලෙසත් ඉල්ලා සිටියේය.

### 9.2. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.සී.සිසිර කුමාර ඉසුරුමුණි මැතිතුමා

මෙම අවස්ථාවේදි සභාව ඇමතු ගරු මන්ත්‍රීතුමා මෙම පළාත් පාලන බල ප්‍රදේශයේ උඩරංවල ප්‍රදේශයට සභාව මගින් කිසිදු ප්‍රතිලාභයක් මෙතෙක් ලබා දි නොමැති බව ප්‍රකාශ කරමින් ඒ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර ප්‍රතිපාදන වෙන් කරවා දෙන ලෙසත්,හත්තැල්ල මාර්ගය සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටියේය.

## 9.3. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එල්.ඒ.ගුණතිලක මැතිතුමා

කෘෂිකර්ම අමාත්‍යාංශයේ යෝජනාවකට අනුව වැව් ප්‍රතිසංස්කරණය කිරිමට නියමිතව ඇති බැවින් එම කටයුතු වලදි සිදු වන ප්‍රමාදයන් වැලැක්විම සඳහා සහන ලබා දෙන මෙන් ඉල්ලා සිටි අතර, ගොවින් දැනුවත් කිරිමට අවශ්‍ය බවද පෙන්වා දුන්නේය.

## 9.4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් වසන්ත මැතිතුමා

හල්ලින්න මාර්ගයේ පොදු ප්‍රවාහන ගැටළු පවතින බවත්, මේ හේතුව නිසා පාසල් වල දරුවන් අසිරුතාවයට පත්ව ඇති බවත්,මල්මීකන්ද මාර්ගයේ වැඩි වශයෙන් වාහන ධාවනය වන නිසා මාර්ගය අබලන් වී ඇති බවත්,මහජන පුස්තකාලයේ සතිඅන්ත පුවත්පත් වල අඩුවක් පවතින බවත් පෙන්වා දුන් ගරු මන්ත්‍රිතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටියේය.

## 9.5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.සිසිර ප්‍රේමකුමාර මැතිතුමා

මෙම පළාත් පාලන බල ප්‍රදේශයට ඕපනායක හා වැලිගෙපොල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකම ඇතුලත් වන බැවින් ,ඒ දෙක සඳහා වෙන වෙනම පැවැත්වෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු දෙකම සඳහා සියළුම සභිකයින්ට සහභාගී වීමට අවස්ථාව ලබා දිය යුතු බව පෙන්වා දුන් ගරු මන්ත්‍රීතුමා දැනට වැලිගෙපොල ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඕපනායක කොට්ඨාශ වල සභිකයින් කැඳවා නොමැති බැවින් ,ඉදිරියේදී පැවැත්වෙන සම්බන්ධීකරණ කමිටුවට කැඳවීම් කරන ලෙස දන්වා යැවිය යුතු බව සඳහන් කළේය.

## 9.6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.දමිත් විජේරත්න මැතිතුමා

මෙම පළාත් පාලන බල ප්‍රදේශයේ වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ර/රංවල විද්‍යාලයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් බලධාරීන්ගේ අවධානයට ලක් නොවීම හේතුවෙන් එම විද්‍යාලය වැසී යන තත්වයට පත්ව ඇති බවට පහත සඳහන් කරුණු අනාවරණය කළේය.

- "අ.පො.ස.(උ.පෙළ) දක්වා අධ්‍යාපන කටයුතු සිදු කල ර/රංවල විද්‍යාලයේ සිසුන් මේ වන විට ක්‍රමක් ක්‍රමයෙන් අඩු වෙමින් පවතී.එම විද්‍යාලයේ විද්‍යාගාර ගොඩනැගිල්ලද දිරාපත් වෙමින් පවතින බැවින්,පාසල් ළමුන් බොහෝ පිරිසක් වෙනත් පාසල් කරා යොමු වෙමින් පවතින අතර, මෙම විද්‍යාලයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් බලධාරීන්ගේ නිසි අවධානය යොමු නොවුණහොත් එම විද්‍යාලය වැසී යා හැකිය"

මෙම කරුණ සම්බන්ධයෙන් බලධාරීන්ගේඅවධානය යොමුකරවන ලෙස ගරු මන්ත්‍රීතුමා මෙහිදී ඉල්ලා සිටියේය.

## 9.7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒ.රෝහණ විජේරත්න මැතිතුමා

පොල්වත්ත හේන මාර්ගයේ සංවර්ධන කටයුතු සඳහා 2012 වර්ෂයේ රුපියල් කෝටි 22 ක මුදලක් ලැබී ඇති බවත්,මාර්ගයේ සංවර්ධන කටයුතු මේවන විට අතරමග නතරවී ඇති අතර සංවර්ධනය කල කොටස් ද නැවත කැඩී ඇති බව සඳහන් කල ගරු මන්ත්‍රීතුමා,මාර්ග සංවර්ධනයට ලැබුණු මුදලට කුමක් වූයේද යන්න බලධාරීන් කිසිවෙක් කිසිදු සඳහනක් නොකරන බැවින්,මේ සම්බන්ධව කරුණු විමසා ගරු ජනාධිපතිතුමාට හා විෂය භාර අමාත්‍යවරයාට ලිපියක් යොමුකරන ලෙස ඉල්ලා සිටියේය.

## 10. <u>සභා රැස්වීමේ නිමාව.</u>

ගරු මන්ත්‍රීතුමන්ලා විසින් දැක්වූ අදහස් හා යෝජනා සම්බන්ධයෙන් කෙටි සමාලෝචනයක් කල ගරු සභාපතිතුමා I Road ව්‍යාපෘතියේ වැඩ තැන් තැන් වල නතරවී ඇති බවත්,රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමේදී ද ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුවන් දැනුවත් කළත් එම ඉදිකිරීම් කටයුතු විධිමත්ව සිදු නොවන බව සඳහන් කළේය.එමෙන්ම ඉත්තගලයාය ප්‍රදේශයේ ජීවත්වන පවුල් 30 ක ජනතාවට ඔවුන් පදිංචිව සිටින ඉඩම් කොටස් ලබා දෙන ලෙස ඉල්ලා සිටියත්,වන ජීවී අධක්ෂක ඉඩ නොදීම හේතුවෙන් ඔවුන් අසරණ වී ඇති බවත්,සඳහන් කළේය.අනතුරුව ගරු සභාපතිතුමා විසින් අද දින සභාවේ කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා සහය දැක්වූ සියලු දෙනාටම ස්තූතිය පල කරමින් සැමට සුබ දවසක් ප්‍රාර්ථනා කර සභාවේ කටයුතු පස්වරු 1.00ට පමණ නිමාවට පත්කරන ලදී.

කැළුම් ප්‍රියංකර ජයසිංහ,<br>
සභාපති,<br>
වැලිගෙපොල ප්‍රාදේශීය සභාව.